බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි

**විධායක සේවා ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.**

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර | යොමු අංකය : ඩී8/21/බ.පරි/නි.නි. | දිනය : | 2012.07.12 |
| 1.2 අමාත්‍යාංශය : පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | යොමු අංකය : MRPR/2/2/32 | දිනය : | 2012.07.25 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : | යොමු අංකය : DMS/JJR//07/01 | දිනය : | 2006.08.18 |
| | DMS/B2/48/01 Vol.II | දිනය : | 2013.09.24 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | යොමු අංකය: EST-2/RECRU/05/4857 | දිනය : | 2011.04.26 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : | යොමු අංකය : NSCC/6/18/096/SR | දිනය : | 2012.05.29 |
| | NSCC/6/5/1/SR | | 2011.09.24 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : | යොමු අංකය : PSC/EST/3/1/76/2012 | දිනය : | 2012.11.07 |
| | PSC/EST/3/1/76/2012 | සං.දිනය : | 2013.05.09 |

02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

03. සේවා ශ්‍රේණිය පිළිබඳ විස්තර

3.1 සේවා ශ්‍රේණිය : විධායක

3.2 ශ්‍රේණි : III, II, I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන කාර්යයන් හා දෙපාර්තමේන්තුවේ හා එහි විෂයය පථයට අයත් රාජ්‍ය ආයතනවල පනත් කෙටුම්පත්, රෙගුලාසි වැනි නීතිමය ලියවිලි සකස් කිරීම නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය, මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම සහ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී විෂයය පථයට අදාළ කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නඩු සඳහා සහභාගී වීම වැනි කාර්යයන් පැවරෙන නිලධර ශ්‍රේණියකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ශ්‍රේණියට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL 1 - 2006

5.2 වැටුප් පරිමාණය : 22935 - 10x645 - 08 x 790 - 17 x 1050 - 53555

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 22935 |
| II | 12 | 30175 |
| I | 20 | 36755 |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| නීති නිලධාරී | III ශ්‍රේණිය | 01 | දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරී |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II, I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | |
| කුසලතා | |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

7.2.2.2 පළපුරුද්ද :

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් වසර 03කට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතුය.

7.2.2.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.4 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවු. 21

7.2.3.2 උපරිම සීමාව : අවු. 45

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 |
| අතිරේක පළපුරුද්ද (වෘත්තීය සුදුසුකම් යටතේ නීතිඥවරයෙකු ලෙස අවශ්‍ය වන අවම අවුරුදු 03ක සේවා කාලයට අමතරව) | 30<br>(එක් වසරකට ලකුණු 05කි ) |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 |
| **එකතුව** | **100** |

7.2.4.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාළ නොවේ.

7.2.4.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : අදාළ නොවේ

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීමෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම සහ වෙබ් අඩවියෙහි පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම

8.1 කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යන්නේ කොපමණ වසර ගණනකට පසුවද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත |
| III වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත |

(විෂය නිර්දේශ ඇමුණුම 1,2,3, බලන්න.).

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

09. රාජ්‍ය භාෂා ප්‍රවීනතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්මේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගැයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් පත්කිරීමේ බලධරයා වෙත නියමිත ආකෘතිය මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීමට පත්කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. සේවා ගණයේ 11 ශ්‍රේණයේ වසර හතක (07)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත(07)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගැයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

V. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීමට පත්කිරීමේ බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

**සංලක්ෂය :**

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයකට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත්කිරීම.

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් |
|---|---|
| අදාළ නොවේ. | |

11.2 තෝරා ගනු ලබන ක්‍රමය : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාල නැත.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14.

I. අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

II. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන : ..........................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : පී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම
තනතුර : පරිපාලන නිලධාරි (වැ.ආ.)
දිනය : 2013.12. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ : අත්සන ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :
තනතුර : එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් (ආයතන)
දිනය : 2013.12.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :
තනතුර : චන්ද්‍රරත්න පල්ලේගම
නිල මුද්‍රාව : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

දිනය : 2013.12. 17

යොමු අංකය : MRPR/2/2/32

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි නීති නිලධාරි
.................... තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................

නම : ..........................

ලේකම්

.................... අමාත්‍යාංශය ජී.එස්. විතානගේ
ලේකම්
පුනරුත්ථාපන හා බන්ධනාගාර
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
35 ඒ, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත,
බොරැල්ල, කොළඹ - 08.

දිනය : 2013.12.31

නිල මුද්‍රාව : ..........................

---

යොමු අංකය : PSC/EST/3/1/76/2012

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි නීති නිලධාරි තනතුර
සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය .................... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................

නම : ..........................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : ~~2013.12~~ 2014/01/23

නිල මුද්‍රාව : ..........................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

01. විභාගයේ නම :- නීති නිලධාරි තනතුරෙහි III වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහයේ විධිවිධාන | පැය 02 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

03. විභාගය පවත්වනු ලබන්නේ වසරකට දෙවරක්.

04. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහයේ විධිවිධාන | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ II, IV, V, VII, VIII, XII, XIII පරිච්ඡේද |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ I, II, III, IV, VI, VIII පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය |

සකස් කළේ :

අත්සන :.............................................

නම :.....ඩී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම.....

තනතුර :.....පරිපාලන නිලධාරි (වැ.ආ.) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට.....

දිනය : 2013.12.17

පරීක්ෂා කළේ :

අත්සන :.............................................

නම :.....එම්.බී.ආර්. පුෂ්පකුමාර.....

තනතුර :.....බන්ධනාගාර කොමසාරිස් (ආයතන) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට.....

දිනය : 2013.12. 17

අත්සන :.............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :.....චන්ද්‍රරත්න පල්ලේගම.....

තනතුර :.....බන්ධනාගාර කොමසාරිස් ජනරාල් බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.....

දිනය : 2013.12. 17

නිල මුද්‍රාව :.............................................

ඇමුණුම 02

01. විභාගයේ නම :- නීති නිලධාරී තනතුරෙහි II වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බන්ධනාගාර ආඥා පනත හා ව්‍යවස්ථාපිත නීති | පැය 02 | 100 | 40 |
| 2. දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥා පනත | පැය 02 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

03. විභාගය පවත්වනු ලබන්නේ වසරකට දෙවරක්.

04. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. බන්ධනාගාර ආඥා පනත හා ව්‍යවස්ථාපිත නීති | 1873 අංක 01 දරණ බන්ධනාගාර ආඥා පනත හා එහි ඇතුළත් ව්‍යවස්ථාපිත නීති සහ ඊට පසුව කරන ලද සංශෝධන ඇතුළත්ව |
| 2. දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥා පනත | දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග අංක 01 සිට 988 දක්වා<br>1939 අංක 38 දරණ බාලාපරාධකරුවන්ගේ ආඥා පනත |

සකස් කළේ :
අත්සන :....................
නම : ජී.ඩබ්ලිව්.යූ. අමරසේන
පරිපාලන නිලධාරී (වැ.ආ.)
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2013.12. 17

පරීක්ෂා කළේ :
අත්සන :....................
නම : එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් (ආයතන)
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2013.12.

අත්සන :....................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : චන්ද්‍රරත්න පල්ලේගම
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
දිනය : 2013.12.
නිල මුද්‍රාව :....................

ඇමුණුම 03

01.විභාගයේ නම :- නීති නිලධාරී තනතුරෙහි I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. සාමාන්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

03. විභාගය පවත්වනු ලබන්නේ වසරකට දෙවරක්.

04. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | (I) කළමනාකරණ මූලධර්ම.<br>(II) කළමනාකරණ ශ්‍රිතයන්.<br>(III) සහභාගිත්ව කළමණාකරණය.<br>(IV) කළමනාකරණ පරිසරය. |

සකස් කළේ :

අත්සන :.............................................

නම :.......... පී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම ..........

තනතුර :.......... පරිපාලන නිලධාරී (වැ.බ.) ..........

දිනය : 2013.12.17

පරීක්ෂා කළේ :

අත්සන :.......... එම්.බී.ආර්. පුෂ්පකුමාර ..........

නම :.......... බන්ධනාගාර කොමසාරිස් (ආයතන) ..........

තනතුර :.......... බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට ..........

දිනය : 2013.12.17

අත්සන :.............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :.......... චන්ද්‍රරත්න පල්ලේගම ..........

තනතුර :.......... බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ..........

දිනය : 2013.12.17 බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

නිල මුද්‍රාව :.............................................